00081

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

පෙර පාසල් අධ්‍යාපන උසස් සහතික පත්‍ර වැඩ සටහන - 2009

මුල් ළමාවියේ අධ්‍යාපනය පිළිබඳ සමාජ සංස්කෘතික සාධක - **ESC 2217**

කාලය - පැය තුනයි.

---

දිනය - 2009.09.12 වේලාව - පෙ.ව. 09.30 - ප.ව. 12.30 දක්වා

---

පළමු කොටසේ සියළුම ප්‍රශ්නවලටද ද දෙවන කොටසේ ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.

## I වන කොටස

01. පූර්ව කාර්මික යුගයේ ළමයා පිළිබඳ සංකල්පය පසු කාර්මික යුගයේ ළමයා පිළිබඳ සංකල්පයෙන් වෙනස්වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

02. ළමා අධ්‍යාපනය පිළිබඳ ප්ලේටෝගේ මත මොනවා ද?

03. "සමාජානුයෝගය" යන සංකල්පය නිර්වචනය කරන්න.

04. අප රටතුල හඳුනාගත හැකි විවිධ වර්ගයේ පවුල් ලැයිස්තු ගත කරන්න.

05. පෙර පාසල් ළමයින්ගේ චර්යා රටා කෙරෙහි බලපෑම් කරන බහුමාධ්‍ය වර්ග 5 ක් නම් කරන්න.

06. මව රැකියාවක නියුතුවීමේ වාසි 02 ක් හා අවාසි 02 ක් කෙටියෙන් දක්වන්න.

07. "අවාසී සහගත පරිසර දරුවා" හඳුනා ගැනීමට උපකාරී වන සාධක 4 ක් සඳහන් කරන්න.

08. "හානිපූර්ණ අධ්‍යාපන ව්‍යාපෘති" පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(ලකුණු 5 x 8 = 40)

## II වන කොටස

09. (i) "ළමා කේන්ද්‍රීය අධ්‍යාපනය " යනුවෙන් අදහස් වන්නේ කුමක් ද?

(ලකුණු 05)

(ii) ළමා කේන්ද්‍රීය අධ්‍යාපනය වෙනුවෙන් රූසෝගේ දායකත්වය විස්තර කරන්න.

(ලකුණු 05)

(iii) ශ්‍රී ලංකාවේ වර්තමාන මුල් ළමාවිය අධ්‍යාපනය වෙත රූසෝගේ මතයන් බලපා ඇති ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

10. (i) පෙර පාසලේදී ඔබ නිරීක්ෂණය කර ඇති දරුවන්ගේ විනය කඩකිරීමේ චර්යාවන් 5ක් ලැයිස්තු ගත කරන්න.

(ලකුණු 05)

(ii) මෙම විනය කඩ කිරීමේ චර්යාවලදී පෙර පාසල් ගුරුවරියක් ලෙස ඔබ ක්‍රියා කළයුතු අන්දම පැහැදිලි කරන්න.

(ලකුණු 15)

11. (i) පවුලේ සාමාජිකයින් විසින් ළමයා තුල සංවර්ධනය කළයුතු සමාජ හරයන් මොනවා ද?

(ලකුණු 08)

(ii) තමා පිළිබඳ ධනාත්මක ස්වසංකල්පය ගොඩනංවා ගැනීමට ප්‍රශංසාව,ත්‍යාගය හා පිළිගැනීම පෙර පාසල් දරුවාට උදව්වන ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

12. (i) තම ළමයින් තුල කියවීමේ පුරුදු සංවර්ධනය කිරීමෙහිලා දෙමාපියන්ට සහාය විය හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ii) "ළමයාගේ සමාජානුයෝග ක්‍රියාවලියෙහිලා ජනසන්නිවේදන මාධ්‍ය සුවිශේෂ කාර්ය භාරයක් ඉටු කරයි." ඔබ එකඟ වන්නේ ද? ඊට හේතු සඳහන් කරන්න.

(ලකුණු 10)

13. "ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ පුනරුත්ථාපන කඳවුරු තුල වෙසෙන ළමුන් විධිමත් අධ්‍යාපන පද්ධතියට අන්තර්ග්‍රහණය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය පියවර ගෙන ඇත."

(i) මෙම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේදී රජයට මතුවිය හැකි යයි සිතන ගැටළු මොනවාද ?

(ලකුණු 12)

(ii) ඔබ හඳුනාගත් ගැටළු විසඳීමට සුදුසු උපායමාර්ග යෝජනා කරන්න.

(ලකුණු 08)

14. පහත දැක්වෙන මාතෘකා දෙකක් (02) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(අ) දෙමාපියන්ගේ දික්කසාදවීම ළමයින්ට බලපාන ආකාරය

(ආ) ළමයාගේ සමාජ සංවර්ධනය සඳහා සමවයස්කයින්ගේ භූමිකාව

(ඇ) ශ්‍රී ලංකාවේ හානිපූර්ණ අධ්‍යාපන වැඩසටහන්වල අවශ්‍යතාව

(ලකුණු 10 x 2 = 20)

OPEN UNIVERSITY OF SRI LANKA LIBRARY

\- හිමිකම් ඇවිරිණි. -

THE OPEN UNIVERSITY OF SRI LANKA

ADVANCED CERTIFICATE PROGRAMME IN PRE-SCHOOL EDUCATION

FINAL EXAMINATION – 2009

ESC 2217 - SOCIO-CULTURAL PERSPECTIVES EARLY CHILDHOOD EDUCATION

DURATION : THREE (03) HOURS

**DATE : 12th September 2009** **TIME : 9.30 a.m. – 12.30 p.m.**

**ANSWER ALL QUESTIONS IN PART I AND THREE QUESTION IN PART II**

## PART – I

01. Explain briefly the difference between the concept of the child in the pre-industrial era and in the post-industrial era.

02. What are the Plato's views on child Education?

03. Define the concept "Socialization"

04. List different types of families that can be identify in our country.

05. Name five (05) types of mass media that affect the behavioural patterns of pre-school children.

06. State briefly two (02) advantages and two (02) disadvantages of having a mother who is working.

07. State four (04) factors that help to identify the "disadvantaged child"

08. Write a brief note on "Compensatory Education Projects"

(5 x 8 = 40 marks)

## PART – II

09. i. What is meant by "Child Centered Education"?

(05 marks)

ii. Describe Rousseau's contribution to Child Centered Education.

(05 marks)

iii. Explain how far the views of Rousseau's has influenced present day Early childhood Education in Sri Lanka.

(10 marks)

10. i. List five (05) acts of undiscipline behaviours you have observed in children in a pre-school.

(05 marks)

ii. Explain how you should handle these acts of undiscipline behaviours as a pre-school teacher.

(15 marks)

11. i. What are the social values that should be developed in child by the members of his/her family?

(08 marks)

ii. Discuss how praise, reward and recognition help a Pre-school child to build a positive view of himself.

12. i. Explain how parents could support to develop reading habits in their children.

(10 marks)

ii. "Mass media plays a significant role in the socialization process of a child". Do you agree? Give reasons.

(10 marks)

13. "Sri Lankan government has taken steps to integrate the children who live in rehabilitation camps in the Nothern Province in Sri-Lanka to the formal education system".

i. What are the problems the government might expect when implementing this policy?

(12 marks)

ii. Propose strategies to address the problems identified above.

(08 marks)

14. Write brief notes on any two (02) of the followings.

i. How divorce of parents influence children.

ii. Role of the peer group on the social development of the child.

iii. The need of Compensatory Education Programme in Sri Lanka.

(10 x 2 = 20 marks)

*- Copyrights reserved -*